මගේ අංකය : අධි.සේ.කො.ස./කඩඉම් (පැරණි)/2021

සියලුම,
සිවිල් අභියාචනා මහාධිකරණ විනිසුරුවරුන්/මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්,මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් /අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත.

**උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවාවේ කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා අයදුම්පත් භාර ගැනීමේ දිනය දීර්ඝ කිරීම.**

මගේ සමාංක හා 2021.04.28 දාතමින් උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවාවේ පහත සඳහන් තනතුරු වලට අදාලව අංක 224/2015 හා 1982.12.23 දිනැති සේවා ව්‍යවස්ථාව යටතේ කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා අයදුම්පත් කැඳවන ලද අතර අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2021.05.28 ලෙස සඳහන් කර ඇත.

I. උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවාවේ භාෂණ පරිවර්තක සේවයේ II වන ශ්‍රේණියේ නිලධරයන් සඳහා වූ 1 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020 (පැරණි ව්‍යවස්ථාව අනුව)

II. උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවාවේ අධිකරණ ලිපිකාර සේවයේ II වන ශ්‍රේණියේ නිලධරයන් සඳහා වූ 1 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020 (පැරණි ව්‍යවස්ථාව අනුව)

III. උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවාවේ අධිකරණ ලිපිකාර සේවයේ II වන ශ්‍රේණියේ නිලධරයන් සඳහා වූ II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2019 (පැරණි ව්‍යවස්ථාව අනුව)

IV. උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවාවේ අධිකරණ ලඝු ලේඛක සේවයේ II වන ශ්‍රේණියේ නිලධරයන් සඳහා වූ I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020 (පැරණි ව්‍යවස්ථාව අනුව)

V. උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවාවේ අධිකරණ යතුරු ලේඛක සේවයේ II වන ශ්‍රේණියේ නිලධරයන් සඳහා වූ I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020 (පැරණි ව්‍යවස්ථාව අනුව)

VI. උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවාවේ අධිකරණ යතුරු ලේඛක සේවයේ II වන ශ්‍රේණියේ නිලධරයන් සඳහා වූ II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020 (පැරණි ව්‍යවස්ථාව අනුව)

02. රටතුල පවතින කොවිඩ් 19 වසංගත තත්වය මත උද්ගත වී ඇති නව ප්‍රවනතා හේතුවෙන් අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී ඇතිවන අපහසුතා සලකා බලා ඉහත සඳහන් කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා 2021 මැයි මස 18 දිනැති ලිපිය මඟින් අයදුම්පත් බාර ගන්නා අවසන් දිනය 2021.06.18 දක්වා දීර්ඝ කරන ලද අතර තවදුරටත් **අයදුම්පත් බාර ගන්නා අවසන් දිනය 2021.06.30** දක්වා දීර්ඝ කරන ලද බව මෙයින් දන්වමි.

03. මෙම ලිපිය ඔබ අධිකරණයේ අදාල සියලුම නිලධාරීන්ට දැන්වීමට කටයුතු කරන්න.

පී.එම්.ටී.බණ්ඩාර
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්

පී.එම්.ටී. බණ්ඩාර
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12.

අත්සන් කලේ / එච්. එස්.සෝමරත්න

අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්

2021 ජූනි මස 21 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේදී ය.